සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

11 | S | I

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය :........................................ බුද්ධ ධර්මය - I කාලය: පැය 01යි.

වැදගත් :

- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.
- ✳ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ✳ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

(1) ගඟ පහළට ම ඇදී යන්නේ ය. මිනිස්සු රාගයෙන් රාගයට ම යති. ද්වේශයෙන් ද්වේශයට ම යති. මෝහයෙන් මෝහයට ම යති. කාමයෙන් කාමයටම යති වෛරයෙන් වෛරයට ම යති. මෙම ''ලෝකය'' බුදු දහම හඳුන්වන්නේ,

1. පටිසෝතගාමී ලෙස ය.
2. අනුසෝතගාමී ලෙස ය.
3. නියත ලෝකය ලෙස ය.
4. අනියත ලෝකය ලෙස ය.

(2) මඩ වගුරෙන් ඉහළට මතු වී එහි නොගැවී සිටින නෙළුම් මල් මෙන් බුද්ධාදී උතුමෝ කෙලෙස් මඩ වගුරෙන් ඉහළට නැගී එහි නොගැවී වැඩ වසති. එම ජීවිතය හැඳින්වෙන්නේ,

1. සරල ජීවිතය යනුවෙනි.
2. සාමාන්‍ය ජීවිතය යනුවෙනි.
3. නියමාකාර ජීවිතය යනුවෙනි.
4. පද්මාකාර ජීවිතය යනුවෙනි.

(3) සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ
මෙම ධම්මපද ගාථාවේ සරල අර්ථය වන්නේ,

1. අපි වෛර කරන්නවුන් අතර අවෛරීව සුවසේ වාසය කරමු, යන්න ය.
2. වෛර කරන්නවුන්ගෙන් ඈත් වී සිටිය යුතු වේ යන්න ය.
3. වෛර කරන්නවුන් සමාජයට පිළිලයකි යන්න ය.
4. වෛරී අදහස් දරන්නන්ට නිවන ඉතා දුර යන්න ය.

(4) ''සිවු සඟරාවත'' යනුවෙන් දැක්වෙන්නේ,

1. චතුරාර්ය සත්‍ය වේ.
2. සතර සතිපට්ඨානය වේ.
3. සතර සංග්‍රහ වස්තු වේ.
4. සතර බ්‍රහ්ම විහරණය වේ.

(5) තමා උපමා කොට අනුන් ගැන සිතන්නට උගන්වා ඇති දහම වන්නේ,

1. දස රාජ ධර්ම දේශනාවයි.
2. දස සක්විති වත් ප්‍රතිපත්තියයි
3. පංච සීල ප්‍රතිපත්තිය යි.
4. අත්තූපනායික ධර්ම පරියාය යි.

(6) දැහැමි ධනෝපායනය යනු,

1. සම්මා කම්මන්තයයි.
2. සම්මා ආජීවය යි.
3. සම්මා සතිය යි.
4. සම්මා වායාමය යි.

(7) අල්පේ ශාඛ්‍ය හා මහේශාඛ්‍ය, දුප්පත් පොහොසත් සමාජ සම්මතයෙන් පහත් හා උසස් නුවණ අඩු හා වැඩි මිනිස්සු ඉන්නවා. මේ විදියට ලෝකේ මිනිසුන් අතර වෙනස්කම් ඇති වෙන්න හේතුව කුමක් ද? යනුවෙන් බුදුරදුන්ගෙන් ප්‍රශ්න නැගුවේ කවුද?

1. අංගුලිමාල.
2. මට්ටකුණ්ඩලී.
3. සුභ මානවක.
4. නන්ද තෙරණුවන්.

(8) බුදු දහමට අනුව මිනිසුන්ගේ සචේතනික ක්‍රියාවන් ප්‍රකට වන, ක්‍රියාත්මක වන දොරටු තුනකි. එනම්

1. කේලාම් කීම, බොරු කීම, පරුෂ වචනයන් ය. 2. කුසල, අකුසල, සසර ය.
3. සිත, සිතුවිලි, සංකල්පනාවන් ය. 4. කය, වචනය, මනස ය.

(9) මරණින් මතු පළමු ආත්ම භවයේ දී විපාක දෙන කර්මය වන්නේ,

1. උප්පජ්ජවේදනීය කර්මය ය. 2. අපරාපරිය වේදනීය කර්මය ය.
3. අහෝසි කර්මය ය. 4. දිට්ඨධම්ම වේදනීය කර්මය ය.

(10) විපාක දෙන ආකාරය අනුව කර්මය සතරාකාර ය. එම කර්මයට අයත් නොවන පිළිතුර තෝරන්න.

1. ගරුක කර්ම. 2. අහෝසි කර්ම. 3. ආචිණ්ණ කර්ම. 4. ආසන්න කර්ම.

(11) කර්මයේ බලපෑම කෙතරම් තීරණාත්මක වුව ද වර්තමාන කර්මවලින් සහ පරිසර සාධක ඇසුරින් අතීත කර්ම ශක්තිය පාදාගැනීමට ද වෙනස් කර ගැනීමට හෝ ඇතැම් විට නැති කර ගැනීමට ද හැකියාව ඇත. එවැනි අවස්ථා නම් කර ඇත්තේ,

1. සැප නිමිති. 2. සත්‍ය නිමිති. 3. සම්පත්ති නමිනි. 4. දේව ධර්ම නිමිති.

(12) බුදු දහමට අනුව හට ගත් සියල්ල අනිත්‍ය ස්වරූපය දැක්වීම සඳහා උපමා යෙදාගෙන ඇත. ඒ අනුව ''සඤ්ඤාව'' සඳහා යොදා ඇති උපමාව වන්නේ,

1. පෙනපිඬක් ය. 2. කෙසෙල් කඳක් ය. 3. මිරිඟුවක් ය. 4. දිය බුබුළක් ය.

(13) ''ආත්ම'' යනු,

1. සංස්කෘත භාෂාමය යෙදුමකි. 2. පාලි භාෂාමය යෙදුමකි.
3. සිංහල භාෂාමය යෙදුමකි. 4. දෙමළ භාෂාමය යෙදුමකි.

(14) ''අනිච්චාවත සංඛාරා - උප්පාද වයධම්මිනෝ '' මෙම දේශනාව අයත් සූත්‍රය වන්නේ,

1. ධම්මචක්කපවත්තන සූත්‍රයේ ය. 2. චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය.
3. මහා සමය සූත්‍රයේ ය. 4. මහා පරිනිබ්බාන සූත්‍රයේ ය.

(15) බුදු දහමෙහි කියවෙන්නේ යමක් ඇති වීමට තවත් දෙයක් හෝ දේවල් කීපයක් හෝ බලපාන බවයි. එසේ ඇතිවන දෙය හැඳින්වීම සඳහා යොදා ගනු ලබන වචනය වන්නේ,

1. හේතුව යන්න ය. 2. ඵලය යන්න ය. 3. සිද්ධිය යන්න ය. 4. වස්තුව යන්න ය.

(16) මහ ඇතුගේ අඩි සලකුණු තුළට වනයේ ඕනෑම සතෙකුගේ පාද සලකුණු ඇතුළු කළ හැකි වන්නාක් මෙන් බුදු දහමේ '' මූලික ඉගැන්වීම'' ලෙස සැලකිය හැක්කේ,

1. පටිච්ච සමුප්පාද දේශනාව ය. 2. ත්‍රිලක්ෂණය පිළිබඳ දේශනාව ය.
3. චතුරාර්ය සත්‍ය දේශනාව ය. 4. කර්මය හා පුනර්භවය පිළිබඳ දේශනාව ය.

(17) අසාර බව අතෘප්තිකර බව, තුච්ඡ බව අර්ථ ශුන්‍ය බව, දැක්වීම සඳහා බුදු දහමේ දක්වා ඇති වචනය වන්නේ,

1. අනිත්‍ය යන වචනයයි. 2. දුක්ඛ යන වචනයයි
3. අනාත්ම යන වචනයයි. 4. අසාර්ථක යන වචනයයි

(18) මම හෙවත් ආත්මය පිළිබඳ හැඟීම මුල්කොට ගෙන ඇතිවන ආශාව විස්තර වන්නේ,

1. භව තණ්හාව මගිනි. 2. විභව තණ්හාව මගිනි.
3. කාම තණ්හාව මගිනි 4. කාම හා විභව තණ්හා ද්විත්වය මගිනි.

(19) නූපන් අකුසල් නොඉපදවීම පිණිසද උපන් අකුසල් දුරු කිරීම පිණිස ද නූපන් කුසල් ඉපිදවීම පිණිසද උපන් කුසල් වැඩි දියුණු කිරීම පිණිස ද සතරාකාර උත්සහය විස්තර වන්නේ,

1. සම්මා දිට්ඨියෙනි. 2. සම්මා සමාධියෙනි
3. සම්මා සතියෙනි. 4. සම්මා වායාමයෙනි.

(20) යථාපිමූලේ අනුපද්දවේ දල්හේ - ඡින්නෝපි රුක්ඛෝ පුණරේවරූහති
යන පාඨයේ අර්ථය වන්නේ,

1. යම් සේ මුල නිරුපද්‍රිතව තිබියදී කපන ලද ගස නැවත නැවත ලියලන බව ය.
2. මුල නොමැතිව ගසක් හට නොගන්නා සේ මැරී යන බව ය.
3. පොළොව මත මිස අහසෙහි ගස් නොවැඩෙන බව ය.
4. පොළොවෙහි සාරය බී වැඩෙන ගස නැවත නැවත දළු ලන බව ය.

(21) සිදුහත් බෝසතාණන් වහන්සේගේ උපත සිදුවූයේ

1. උපවර්තන නම් සල් උයනේ දීය.
2. ජීවක අඹ වනයේ දී ය.
3. ලුම්බිණි නම් සල් උයනේදී ය.
4. මිගදාය නම් රමණීය ස්ථානයේ දී ය.

(22) මහණෙනි, ඒ මම කුසලය නම් කුමක්දැයි සොයන සුලු වූයෙමි. මගධ දනව්වෙහි පිළිවෙලින් සැරිසරන්නෙමි. උරුවේලයෙහි සේනානි ගම වෙතැ පැමිණියෙමි. බුදුරදුන්ගේ මෙම ප්‍රකාශනය ඇතුළත් සූත්‍ර දේශනාව වන්නේ,

1. දම්සක් පැවතුම් සූත්‍රයේ ය.
2. අරියපරියේසන සූත්‍රයේ ය.
3. අනත්තලක්ඛන සූත්‍රයේ ය.
4. අග්ගඤ්ඤ සූත්‍රයේ ය.

(23) බෝසතාණන් වහන්සේ දුෂ්කර ක්‍රියා කළ කාලය

1. වසර හයකි.
2. වසර හතරකි.
3. වසර පහකි.
4. වසර අටකි

(24) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසර ආශ්‍රිතව ද වස් විසූ සේක. උන්වහන්සේ 5 වන වස් කාලය ගත කළේ,

1. භේෂකලා පර්වතයෙහි ය.
2. චාලිය පර්වතයෙහි ය.
3. පාරිලෙය්‍ය වනයෙහි ය.
4. විශාලා මහනුවර කූඨාගාර ලෙනෙහි ය.

25) සුදත්ත හෙවත් අනේපිඩු සිටුතුමා මුලින් ම බුදුරජාණන් වහන්සේ මුණ ගැහුණේ,

1. කලන්දක නිවාප නම් ලෙහෙනුන්ගේ අභය භූමියේදී ය.
2. ඉසිපතන මිගදායේ දී ය.
3. රජගහනුවර සීත වනයෙහි වැඩ සිටිය දී ය.
4. ගිජ්ජකුට පර්වතයෙහි සූකරකත ලෙනෙහිදී ය.

(26) මහී ගංගා තීරය අසල සොඳුරු සවස් කාලයේදී බුදුරදුන් දේශනා කළ සූත්‍රය වන්නේ,

1. ධනිය ගෝපාල සූත්‍රය යි.
2. ස්මඤ්ඤඵල සූත්‍රය යි.
3. සෝන දණ්ඩ සූත්‍රය යි.
4. කසී භරද්වාජ සූත්‍රය යි

(27) නොසලකා හැරීමට ලක්ව සිටි භද්‍රවතිකා නම් ඇතින්නට පුරුදු උවටැන් ලබාදීමට බුදුරජාණන් වහන්සේ උපදෙස් ලබා දුන්නේ, කිනම් රජුට ද?

1. කොසොල් රජතුමාට.
2. උදේනි රජතුමාට.
3. අජාසත්ත රජතුමාට.
4. බිම්බිසාර රජතුමාට.

(28) සදිසා නමින් සමාජය කොටස් හයකට බෙදා දක්වෙන, එහි ඒ ඒ සමාජ කණ්ඩායම් අතර අන්‍යොන්‍ය වශයෙන් පැවතිය යුතු සාරධර්ම දක් වූ සූත්‍ර දේශනාව වන්නේ,

1. රතන සූත්‍රය ය.
2. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය ය.
3. මංගල සූත්‍රය ය.
4. සිගාලෝවාද සූත්‍රය ය.

(29) සදිසාවන්ගේ දකුණු දිසාවෙන් නියෝජනය කරනු ලබන්නේ,

1. පැවිද්දන් - ගිහියන් ය.
2. මව්පියන් - - දූ දරුවන් ය.
3. ගුරුවරු -- ශිෂ්‍යයන් ය.
4. සේව්‍ය - - සේවකයන් ය.

(30) බටහිර දිශාවෙන් නියෝජනය කරනු ලබන සැමියා බිරිඳට ඉටුකළ යුතු යුතුකම් අතරින් අදාල නොවන පිළිතුර තෝරන්න.

1. ගරු කිරීම.
2. උපයන ධනය ආරක්ෂා කිරීම.
3. ගෙදර වගකීම පැවරීම.
4. අවමං නොකිරීම.

(31) සීලයෙහි ආනිසංස පහෙන් මෙලොව ජීවිතයේදී සිල්වතාට අත්දැකීම් ලබාගත හැකි ආනිසංස ගණන කීය ද?

1. හතරකි. 2. තුනකි. 3. දෙකකි. 4. එකකි.

(32) දුසිල්වත්ව ජීවත්වන්නාගේ මරණාසන්න මොහොත අතිශය බියකරු ය. මරණාසන්න මොහොතේ ඌරකු මෙන් කෑ ගසමින් දුක් විඳි පුද්ගලයා වන්නේ,

1. මහාධන සිටුවරයා ය. 2. මට්ටකුණ්ඩලී ය.
3. චුන්දකර්මාකාර ය. 4. චුන්ද සූකරික ය.

(33) එළඹ සිටි සිහිය, යහපත් කල්පනාව, හරි වැරදි දැකීමෙන් කටයුතු කිරීම, මතක ශක්තිය අර්ථ ගන්වන්නේ,

1. ධම්ම ජීවිනෝ යන වචනයෙනි. 2. උට්ඨානවතෝ යන වචනයෙනි.
3. සතිමතෝ යන වචනයෙනි. 4. සුචිකම්මස්ස යන වචනනෙි.

(34) ''මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේ ය.'' මෙම ප්‍රකාශය කළ උදාර පාලකයා කවුද?

1. වීර දුටුගැමුණු මහ රජතුමා. 2. මහා පරාක්‍රමබාහු රජතුමා.
3. ධාතුසේන රජතුමා. 4. නිශ්ශංකමල්ල රජතුමා.

(35) සඟරජ පදවිය ලැබ තම ආරාමයට වැඩම කළ වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමි තල්පතක් ගෙන තමාට ම අවවාද පිණිස ලියූ වැකිය වන්නේ,

1. පරාර්ථය සඳහා කටයුතු කරන්නන් ය යන්න ය.
2. උඩගු නොව මහණ යන්න ය.
3. නොපසුබස්නා වීර්යයෙන් කටයුතු කරන්න යන්න ය.
4. සසුන් කෙත රැකගන්න යන්න ය.

(36) සියම් දේශයේ උප සම්පදාව මෙරටට ගෙන ඒම සඳහා සරණංකර සාමණේරයන්ට උපකාර කළ මෙරට පාලකයා වූයේ,

1. කීර්ති ශ්‍රී රාජසිංහ රජු ය. 2. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ය.
3. මානවම්ම රජු ය. 4. මේඝවර්ණාභය රජු ය.

(37) විඤ්ඤාණ ස්කන්ධය යනු,

1. සිත් තුළ උපදින සටහන් නිමිත්තයි. 2. වින්දනය විඳීමයි.
3. අරමුණු දැනගැනීම, විජානනය යි. 4. ශරීරය, කය, භෞතික සැලැස්ම යි.

(38) සතර මහා භූතයන්ට අයත් ''වායෝ'' යනු

1. උෂ්ණ සීතල ගතියයි. 2. තද ගතියයි.
3. ද්‍රව ගතියයි. 4. සෙලවෙන ගතියයි.

(39) භාවනාවට පිවිසෙන තැනැත්තා ඉටු කර ගත යුතු පූර්ව අවශ්‍යතා සඳහා අයත් නොවන පිළිතුර තෝරන්න.

1. ධර්මය ශ්‍රවණය කිරීම. 2. ධර්මය දේශනා කිරීම.
3. සිල්වත් වීම. 4. කල්‍යාණ මිත්‍ර ආශ්‍රය.

(40) චිත්තං සමේතීති සමථෝ යන්නෙහි තේරුම වන්නේ,

1. විශේෂ වශයෙන් දැක්වීම සමථයයි. 2. කුසල් දම් වැඩිදියුණු කරන්නේ සමථයයි
3. සිතිවිලි අතරේ ගමන් කරන්නේ සමථයයි. 4. සිත සංසුන් කරන්නේ සමථයයි

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

11 S II

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය :........................................ බුද්ධ ධර්මය - II කාලය: පැය 02යි.

වැදගත් :

⁕ පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

⁕ පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.

(1) (i) සිදුහත් කුමරුට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයාගේ නම කුමක් ද?

(ii) බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනාව දේශනා කරනු ලැබුවේ කුමන ස්ථානයකදී ද?

(iii) ''සමග්ගා හෝථ මා විවදථ'' යන පාඨයේ අර්ථය ලියන්න.

(iv) සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ
වේරිනේසු මනුස්සේසු - විහරාම අවේරිනෝ
මෙම ගාථාවෙන් හෙළි කරන බුදු දහමේ ඉගැන්වෙන ධර්ම කරුණු කුමක් ද?

(v) බුදු දහමේ දැක්වෙන සිරිත් හා විරිත් යන්නෙහි අදහස පැහැදිලි කරන්න.

(vi) වැලිවිට සරණංකර මා හිමි පාණන් විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(vii) සිව්පසය නම් කරන්න.

(viii) බුදුරජාණන් වහන්සේ දේශනා කළ සිල් රැකීමෙන් ලැබෙන ආනිසංශ පහෙන් දෙකක් ලියන්න.

(ix) විපාක දෙන ආකාරය අනුව ද කර්මය සතර ආකාර ය ඒවායින් දෙකක් ලියන්න.

(x) සතර පෙර නිමිති ලියා දක්වන්න.

(2) (i) බුදුරජාණන් වහන්සේ අම්බට්ඨ, සිංසපා සූත්‍ර දේශනා කළ ස්ථාන දෙක නම් කරන්න.

(ii) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ ස්ථාන තුනක් නම් කරන්න.

(iii) පාරිසරික සම්පත් සුරකීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන මොනවාදැයි පැහැදිලි කරන්න.

(3) (i) සිඟාලෝවාද සූත්‍රයේ දී නැගෙනහිර හා උඩදිශාව සඳහා උපමා කරනු ලැබුවෝ කවරහු ද?

(ii) ඉහත (i) හි දැක් වූ එක් සමාජ කණ්ඩායමකින් ඔබට ඉටු විය යුතු යුතුකම් තුනක් ලියන්න.

(iii) සාර්ථක ගෘහ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය පදනම බුදු දහමෙන් ඉගැන්වෙන ආකාරය පැහැදිලි කරන්න.

(4) (i) විපාක දෙන කාලය අනුව කර්මයේ ප්‍රභේද හතරක් වේ. ඉන් දෙකක් ලියන්න.

(ii) ඉහත (i) හි දැක් වූ කර්ම ප්‍රභේදයක් හඳුන්වන්න.

(iii) කුසලා කුසල කර්ම මෙලොව පරලොව ජීවිත සාර්ථක කරගැනීමට ඉවහල්වන අයුරු පැහැදිලි කරන්න.

(5) (i) චතුරාර්ය සත්‍ය නම් කරන්න.

(ii) චතුරාර්ය සත්‍ය ආර්ය සත්‍ය ලෙස හඳුන්වන්නේ ඇයිදැයි කෙටියෙන් දක්වන්න.

(iii) අසීමිත ආශාවන් නිසා මිනිසුන් දුකට පත්වන සැටි චතුරාර්ය සත්‍ය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(6) (i) පුද්ගලයාගේ කීර්තිය (යසස) වැඩීමට ඉවහල් වන කරුණු අවධාරණය කරමින් දේශනා කළ ධම්මපද ගාථාව ලියන්න.

(ii) ඉහත ගාථාවේ අදහස ලියන්න.

(iii) ජීවිතයක් සාර්ථක කර ගැනීමට බුදුරජාණන් වහන්සේගේ මෙම දේශනාව කෙතෙක් දුරට අදාළ වේ දැයි විමසන්න.

(7) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) දුටුගැමුණු මහ රජතුමා

(ii) සමථ භාවනාව

(iii) ත්‍රිලක්ෂණය

(iv) ආගමික සහජීවනය

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

11 | S | I II

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 10 - 2019

## බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 3 | 21 | 3 | 31 | 1 |
| 2 | 4 | 12 | 3 | 22 | 2 | 32 | 4 |
| 3 | 1 | 13 | 1 | 23 | 1 | 33 | 3 |
| 4 | 3 | 14 | 4 | 24 | 4 | 34 | 1 |
| 5 | 4 | 15 | 2 | 25 | 3 | 35 | 2 |
| 6 | 2 | 16 | 3 | 26 | 1 | 36 | 1 |
| 7 | 3 | 17 | 2 | 27 | 2 | 37 | 3 |
| 8 | 4 | 18 | 1 | 28 | 4 | 38 | 4 |
| 9 | 1 | 19 | 4 | 29 | 3 | 39 | 2 |
| 10 | 2 | 20 | 1 | 30 | 2 | 40 | 4 |

### II පත්‍රය

(1) (i) සර්ව මිත්‍ර නම් බමුණු පඬිවරයා / විශ්ව මිත්‍ර බමුණා
(ii) බරණැස ඉසිපතන මිගදායෙහි දී
(iii) සමගි වන්න විවාද නොකරන්න.
(iv) අපි වෛර කරන්නවුන් අතර අවෛරී ව සුවසේ වාසය කරමු.
(v) සිරිත් යනු කළයුතු යහපත් දේ කිරීමයි
විරිත් යනු නොකළ යුතු අයහපත් දේ නොකිරීමයි.
(vi) මුණිගුණාලංකාරය, / සාරාර්ථ සංග්‍රහය, / රතනත්‍රය ප්‍රණාම ගාථා සන්නය, / සතර බණවර සන්නය
(vii) චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස
(viii) 1. මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම
2. කීර්තිය පැතිරීම
3. ඕනෑම පිරිසක් මැදට නිර්භය ව එළඹීමට හැකි වීම
4. සිහි මුලා නොවී කලුරිය කිරීම
5. මරණින් මතු සුගතියෙහි උපත ලැබීම.
(ix) 1. ගරුක කර්ම 2. ආසන්න කර්ම
3. ආචිණ්න කර්ම 4. කටත්තා කර්ම
(x) මහල්ලෙක්, ලෙඩෙක්, මළ මිනියක්, පැවිදි රුවක්

(2) (i) අම්බට්ඨ සූත්‍රය - - ඉච්ඡානංගල වනයේ වැඩ සිටියදී
සිංසප සූත්‍රය - - ඇට්ටේරියා වනයෙ වැඩ සිටිය දී
(ii) පළමු වන වස් කාලය -- බරණැස් ඉසිපතන මිගදාය තුළ
දෙවන හා තෙවන, සිව්වන වස් කාලය -- වේළුවනාරාමය තුළ
පස්වන වස්කාලය -- විශාලා මහනුවර කූඨාගාර ලෙනෙහි
හයවන වස්කාලය -- මකුල පර්වතයෙහි.
අටවන වස් කාලය -- භේෂකලා පර්වතයෙහි
දහවන වස් කාලය -- පාර්ලෙය්‍ය වනයෙහි
දහතුන, දහඅට, දහනවය වස් කාලය -- චාලිය පර්වතය

(iii) ජීව අජීවී වශයෙන් වර්ගීකරණයට ලක් කෙරෙන ස්වාභාවික පරිසරය සුරකීම තුළින්
* පිරිසිදු පානීය ජලය
* ස්වාභාවික වනාන්තර හා කඳු හෙල් ආරක්ෂා වීම
* පිරිසිදු වාතාක්‍ෂය ලබා ගැනීම.
මේ අනුව ස්වාභාවික පරිසරයේ ආරක්‍ෂාව තහවුරු කිරීම මිහිතලයේම ජීවත් වන සියලු සත්වයින්ගේ ජීවිත සුරක්‍ෂිත කිරීමයි.
මෙවැනි තොරතුරු අදාල කරගනිමින් පිළිතුරු සපයා ඇත්නම් පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.

(3) (i) නැගෙනහිර - මව්පියන් දූදරු
උඩ දිශාව - ගිහි පැවිදි
මව්පිය ගුරුවරුන් / මාතා පිතා දිසා පුබ්බා ආචරියා
පාලියෙන් ලියා තිබුණත් ලකුණු ලබා දෙන්න.

(ii) <u>**මව්පියන්ගෙන් දූ දරුවන්ට ඉටුවිය යුතු යුතුකම්**</u>
1. දරුවන් වරදින් මුදවා ගැනීම
2. ඔවුන් යහපත් කටයුතුවල යෙදවීම
3. ඉගෙනීමේ කටයුතුවල යෙදවීම
4. ගැළපෙන ආවාහ විවාහ කරදීම
5. සුදුසු කල්හි සම්පත් පවරා දීම

<u>**ගුරුවරුන් විසින් ශිෂ්‍යයන්ට ඉටුකළ යුතු යුතුකම්**</u>
1. මැනවින් හික්මවීම
2. මැනවින් ඉගැන්වීම
3. දන්නා සියලුම ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම
4. තම මිත්‍රයින්ට ශිෂ්‍යයා හඳුන්වා දීම.
5. ශිෂ්‍යයා ආරක්ෂා කර ගැනීම

* එක් සමාජ කණ්ඩායමකින් කරුණු තුනක් නම් කර තිබේ නම් ලකුණු 03 ක් ලබා දෙන්න.
* එකම කණ්ඩායමකින් පිළිතුරු බලාපොරොත්තු වේ.

(iii) සමාජයක වැදගත්ම ඒකකය වන්නේ පවුලයි. පවුලේ ප්‍රධානම සාමාජිකයින් වන්නේ සැමියා සහ බිරිඳයි. පවුල් සංස්ථාවේ පැවැත් රඳා පවතින්නේ බිරිඳත් සැමියාත් අතර ඇති සම්ධන්ධතාවය මතයි. පවුලේ සාමයත් සතුටත් දියුණුවත් දූ දරුවන්ගේ යහපතක් සැලනේනේ පවුල් සංස්ථාවේ යහපැවැත්ම මතය. බටහිර දිසාව ලෙස දැක්වෙන අඹු සැමි යුතුකම් දහයක් සිඟාලෝවාද සූත්‍රයේ දී සිගාල ගෘහපතියාට පෙන්වා දී ඇත.

<u>**සැමිය - බිරිඳට**</u>
1. ගරු කිරීම.
2. අවමන් නොකිරීම.
3. පරදාර සේවනයෙහි නොයෙදීම.
4. ගෙදර වගකීම් පැවරීම.
5. ඇඳුම් පැළඳුම් සපයා දීම.

<u>**බිරිය - සැමියාට**</u>
1. ගෙදර කටයුතු මැනවින් සංවිධානය කිරීම
2. ඇසුරු කරන පිරිසට මැනවින් සංග්‍රහ කිරීම
3. පර පුරුෂ සේවනය නොකිරීම
4.. උපයන ලද ධනය ආරක්ෂා කිරීම
5. සැම කටයුත්තකම දක්ෂ වීම හා අනලස් වීම

වන කරුණු ඉටු කළ යුතුය.

අඹු සැමි සබඳතා බිඳ වැටීම නිසා පවුලේ සංස්ථාව මුහුණ දෙන්නේ විශාල අර්බුදයකට ය. එම නිසා පවුලේ සාමය ද ප්‍රීතිය ද නැති වී යයි. විශ්වාසය පළුදු වේ. යින් දූ දරුවෝ ද අසරණ වෙති. නිතර අඬ දඹර ඇතිවේ. පවුලේ දියුණුව ඇණ හිටී. දෙවියකු හා දෙවඟනක මෙන් අඹු සැමියන් ජීවත් වනු දැකීම බුදු දහමේ අපේක්‍ෂාවයි

(4) (i) 1. දිට්ඨ ධම්මවේදනීය කර්ම
2. උපජ්ජවේදනීය කර්ම
3. අපරාපරිය වේදනීය කරුම
4. අහෝසි කර්ම

(ii) 10 ශ්‍රේණියේ 69 පිටුව සඳහන් අදාල පිළිතුරකට ලකුණු ප්‍රධානය කරන්න.

(iii) මිනිසාගේ සචේතනික ක්‍රියාවන් සිදුවන දොරටු තුනකි. එනම් සිත, කය, වචන යන තුනයි. මෙම තිදොරින් සිදු කරන කර්ම කුසල හා අකුසල කර්ම ලෙස දෙයාකාරය. අකුසල කර්ම මෙලොවදීත් පරලොවදීත් සංසාරේදීත දක් උපදවන, අවැඩදායක ක්‍රියාවන් ය. මෙලොවදීත් සසර දීත්, සැප උපදවන, වැඩදායක ක්‍රියා කුසල කර්ම වේ. කුසල අකුසල කර්ම පිළිබඳව අවබෝධය මෙලොව පරලොව යහපත පිණිස හේතුවේ. මෙහිදී දස අකුසල හා දස කුසල කර්ම පිළිබඳ අවබෝධය ද අත්‍යාවශ්‍ය වේ. (10 ශ්‍රේණිය - 68 පිටුව)
* පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.

(5) (i)
1. දුක්ඛ ආර්ය සත්‍ය (දුක)
2. දුක්ඛ සමුදය සත්‍ය (දුක හටගැනීමට හේතුව)
3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය (දුක නැති කිරීම)
4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය (දුක නැති කිරීමේ මග)

* දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යනුනේ ලියා තිබුණ ද ලකුණු ලබා දෙන්න.

(ii) චතුරාර්ය සත්‍ය ආර්ය සත්‍ය ලෙස හැඳින්වේ. ශ්‍රේෂ්ඨ උතුම් සත්‍ය යනු එහි අදහසයි. රාග, දෝෂ මෝහ ආදී සියලු කෙලෙස් මුලිනුපුා දමා ආර්ය භාවයට පත්කරන නිසා මේ ධර්ම ආර්ය සත්‍ය ලෙස හැඳින්වේ. එසේම බුද්ධාදී උතුමන් විසින් අවබෝධ කරනු ලැබූ සත්‍ය ධරම් නිසාද ආර්ය සත්‍ය ලෙස හඳුන්වයි.

(iii) සත්ත්වයා විවිධාකාර දුක් පීඩාවලට පත් වන්නේ අහේතුකව නොවේ. කිසියම් දෙවියකුගේ හෝ බ්‍රහ්මයකුගේ කැමැත්ත අනුව ද නොවේ. හේතු සාඳධක ඇතිව ය. එහි මූලික හේතුව නම් මිනිස් සිත් සතන් තුළ මුල් බැස ඇති අසීමිත ආශාවයි. එම තණ්හාව මුල්කොටගත් සියලු කෙලෙස් දුකට හේතු වේ. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම උදාන වාක්‍යයෙන් නකියවෙන පරිදි තමන් වහන්සේ සසර නොයෙක් ආත්මවල ඉපදී ජරා මරණාදී දුක් දොම්නස්වලට මුහුණ දුන්නේ තණ්හාව නිසා ය. යම් සේ ගසක මුල ශක්තිමත්ව නොගැල වී පවත්තේ ද ඒ තාක් කල් එම ලස නැවත නැවතත් ලියලන්නා සේ අප සිත් සන් තුළ තණ්හාව මුල් බැස ඇති තාක් සසර දුක හට ගනියි.

දම්ක් පැවතුම් සූත්‍රයට අනුව පුනර්භවය ඇති කරන ඇල්ම සතුට සහිත වූ ඒ ඒ තැන සිත අලවන තණ්හාව කුක්ඛ සමුදය ආර්ය සත්‍යයි. සාමාන්‍ය ජීවතයේදී වුව ද මිනිසුන් දුක් විඳින්නේ ආසාව ඉටු කර ගැනීමට යි. විවිධ ගැටලු තාඩන පීඩන ආදියට පවා ගොදුරු වන්නේ ආශාවන් පසුපස යාමෙනි. මිනිස් සිත් තුළ මෙන්ම මිනිසුන් අතර ද විවිධ ගැටුම් කල කෝලාහල ආදිය ඇති වන්නේ ද මෙකී තණ්හාව නිසාමය. එබඳු ගැටුම් නිසා ද මිනිසුන් දුකට පත් වෙති. නිරතුරුවම සත්ත්වයා මදිකමින් හෙවත් ඌණ බවියන් පෙළෙමින් ඇති වීමක් නැති ව අතෘප්තියෙන් යුක්තව තණ්හා ආශාවන් හි දාසයකු වී ක්‍රියා කරමින් දුක් විඳින බව බුදු දහම පෙන්වා දෙයි.

තවද සසර දුකට හේතු වන විවිධ ක්ලේශ ධර්ම අතර මූලික වන තණ්හාව මංගල ධරම් දේශනාවේදී තුන් ආකාරයකට බෙදා දක්වා තිබේ. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා වශයෙනි. මේ සියල්ල තුළින් ම දැක්වෙනුයේ මිනිසා ආශාවන් නිසා දුකට පත්වන අයුරු ය.

(6) (i)
උට්ඨානවතෝ සතිමතො
සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්ස ච ධම්මජීවිනෝ
අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති

(ii) උත්සාහයෙන් ද නිවැරදි සිහියෙන් දයුතු නිදෝස දේ විමසා බලා කරන තැන්පත් දැහැමි දියි පැවතුම් ඇති. නොපමා වූ පුද්ගලයාගේ කීර්තිය මනාව වැඩේ.

(iii) ජීවිතයක් සාර්ථකත්වයට පත්වීමට අත්වැල් සපයන ගාථා අතරින් මෙම ගාථාව අගනා උපදේශයක් සපයනු ඇත. උත්සාහවන්ත ව මනා සිහිය ඇති නිවැරදි දෙය පරීක්ෂාකාරීව කරන හික්මීමෙන් යුත් දැහැමි ව ජීවත් න තැනැත්ගේ යසස වැඩෙන්නේ ය. මෙය උත්සාහය පෙරටු කොට ගෙන ගුණ නුවණින් ක්‍රියා කොට ජීවිත ජයගත් සමකාලීන තරුණයෙකුට බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද දේශනයකි. මෙම දේශනාවෙහි සඳහන් යසස් වර්ධනය යනු ධනධාන්‍යාදී භෝග සම්පත් වැඩි දියුණ් වීම හා කීර්ති ප්‍රශංසාවන් ද වැඩි දියුණු වීමයි. එසේ මෙලොවදී ම යසස් වැඩි දියුණු වීම ප්‍රීතිමත් සාර්ථක ජීවිතයක් ගත කිරීමට උපකාරී වේ. එහෙත් එය සිදුවන්නේ දේව බලයකින් හෝ පෙර කළ කර්මය අනුව ම ද නොවේ. හේතුවක් යුත්තියක් නැතුව ද නොවේ. ඒ සඳහා තිබිය යුතු හැකියාවන් හා ගුණ ධර්ම සත් ආකාර බව මෙම ගාථාවෙන් උගන්වයි.

1. උට්ඨානවතො
2. සතිමතො

5. සඤ්ඤත
6. ධම්මජීවි

3. සුචිකම්ම　　　　7. අප්පමත්ත
4. නිස්ම්මකාරී　　　　මෙම කරුණු ජීවිතයක සාර්ථකත්වයට ඉතා වැදගත් වේ.

(7) (i) <u>**දුටුගැමුණු මහ රජතුමා**</u>

* <u>**ජීවන තොරතුරු:-**</u>

පියා :- රුහුණු පුර පාලනය කළ කාවන්තිස්ස රජු

මව :- විහාර මහා දේවිය

සහෝදරයා:- සද්ධාතිස්ස කුමරු

* <u>**සටන් කළේ:-**</u> අනුරාධපුර පාලනය කළ එළාර රජු සමඟ

* <u>**රට එක්සත් කළ අයුරු:-**</u> තම පියාගේ ඇවෑමෙන් පසු තම මෑණියන්ගේ සොහොයුරු තිස්ස කුමරුගෙන් මහා සංඝරත්නයෙත් ආශිර්වාදය මැද සේනාව සංවිධානය කර විජිතපුර නම් ස්ථානයේ දී මුහුණට මුහුණ සටන් කර එළාර රජු පරාජයට පත්කර ලංකාව එක් සේසත් කළේ ය.

* <u>**අභීත සටන් පාඨය :-**</u>

''මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේ ය.''

* <u>**ශාසනික සේවා: -**</u>

රුවන්වැලි මහා සෑය, මිරිසවැටි මහා දාගැබ, ලෝවා මහා පාය වැනි ආගමික වෙහෙර විහාරස්ථාන සකස් කර දීම වසර 24 වෙසක් වෙසක් උත්සව පැවැත්වීම. ආරෝග්‍යශාලා පිහිටුවා ගිලන්හල් සේවාවක් ආරම්භ කරීම. තමා කළ සියලු යහපත් ක්‍රියා පින් පොතෙහි සටහන් කීරීම.

* ඉහත තොරතුරු අන්තර්ගත කරමින් පිළිතුර ලියා තිබිය යුතුයි. සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.

(ii) <u>**සමථ භාවනාව**</u>

සිත සන්සුන් කරන භාවනාව සමත භාවනාවයි. භාවනාව ධර්මය තුළ නිර්වචනය කර ඇත්තේ ''භාවිති කුසල ධම්මේ ආසේවති වඩ්ඪේති ස්ථායතානි භාවනා'' කුසල් දම් වැඩිදියුණු කරන මානසික අභ්‍යාසය භාවනිවයි. ''චිත්තං සමේතීනි සමථෝ, සිත සන්සුන් කරන්නේ සමථයයි යනුවෙනි.

සමත් භාවනාව වඩන පුද්ගලයා තුළ ගුණාංග තුනක් තිබිය යුතුය.

1. ඉන්ද්‍රිය සංවරය (ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රිය සංවර කිරීම)
2. සති සම්පජඤ්ඤ (හිඳීම, සිටීම, ඇවිදීම, ආදී සියලු ක්‍රියාවන්හි දී අවබෝධයෙන් සිටීම.
3. සන්තුට්ඨිතා (ලද දෙයින් සතුටු වීම)

සමථ භාවනාව වැඩීමෙන් ධ්‍යාන සමාපත්ති ලබා ගැනීමමට හානි වේ. ආචාරයවරයෙකු විසින් චරිතයට ගැලපෙන කර්මස්ථානය ලබා දීම සිදු කරයි. ඒ අනුව චරිත හයකි.

1. රාග චරිත　　　　2. දෝස චරිත
3. මෝහ චරිත　　　　4. සද්ධා චරිත
5. බුද්ධි චරිත　　　　6. විතක්ක චරිත යනුවෙනි,

භාවනාවට පිවිසෙන තැනැත්තා භාවනාවට පෙර ඇති කරගත යුතු පූර්ව අවශ්‍යතා වශයෙන් දර්මයේ සඳහන් වන්නේ,

1. කල්‍යාණ මිත්‍ර ඇසුර　　　　2. සිල්වත් වීම.
3. ධර්ම ශ්‍රවනය　　　　4. වීර්ය
5. ප්‍රඥාව යනුවෙනි,

<u>**සමථ භාවනාව වැඩීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන**</u>

1. කෙලෙස් සිතුවිලි පාලනය වීම.　　　　2. මතක සක්තිය වැඩීම
3. සිතෙහි තෘප්තිමත් ස්වභාවයක් ඇතිවීම.　　　　4. අසහනය නැති වී ප්‍රශ්න පෙනුමක් ඇතිවීම.
5. නිරෝගී වීම.　　　　6. සිත විසිරි යෑමට නොදී එකඟ කරගැනිමට හැකි වීම.

* ඉහත කරුණු ඇතුලත් කරමින් පිළිතුර ලියා තිබිය යුතුයි. සමථයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.

(iii) <u>**ත්‍රිලක්ෂණය**</u>

බුදුවරුන් ලොව උපන්නා ද නූපන්නා ද සදාකාලික ව ලාව පවත්නා සත්‍ය ත්‍රිලක්ෂණයයි. දේශය කුමක් වුවත් කාලය කුමක් වුව ද ත්‍රිලක්ෂණය ලොව පවතියි. එ බැවින් එය විශ්ව සාධාරණ ධර්මතාවකි. දේශ කාල වශයෙන් වෙනස් නොවන සසත්‍යයකි. ත්‍රිලක්ෂණය බුදු දහමේ මූලික ඉගැන්වීමකි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනු එයයි. උපේක්ෂාවෙන් කටයුතු කළ හැකි වීම හා අවසානයේ නිර්වාණවබෝධය සාක්ෂාත් වී ම තිලකුණු දැක්මේ ප්‍රතිඵල වේ.

* ඉහත තොරතුරු සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.